සැබෑ ඥාතී සම්බන්ධකම් පවත්වන්නා ප්රතිලාභ බලාපොරොත්තු නොවෙයි. නමුත් සෑබෑ ඥාතී සම්බන්ධකම් පවත්වන්නා ඔහුගේ ඥාතීන් සම්බන්ධතා ඔවුන් විසින් බිඳ දැමුව ද ඔහු එය පවත්වා ගනියි

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "සැබෑ ඥාතී සම්බන්ධකම් පවත්වන්නා ප්රතිලාභ බලාපොරොත්තු නොවෙයි. නමුත් සෑබෑ ඥාතී සම්බන්ධකම් පවත්වන්නා ඔහුගේ ඥාතීන් සම්බන්ධතා ඔවුන් විසින් බිඳ දැමුව ද ඔහු එය පවත්වා ගනියි."
[صحيح] [رواه البخاري]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පවසයි: සැබැවින්ම ඥාතී සම්බන්ධකම් සුරැකීමේ දී හා සමීප ඥාතීන් සමඟ දැහැමි අයුරින් කටයුතු කිරීමේ දී පූර්ණවත් මිනිසා, යහපත බලාපොරොත්තු වෙන් යහපත කරන කෙනෙකු නොවන බව දන්වා සිටියේය. නමුත් පූර්ණවත් ලෙස සැබෑ ඥාතී සම්බන්ධකම් පවත්වන්නා, ඔහුගේ ඥාතිත්වය අනෙකා විසින් බිඳ දැමුව ද, ඔවුන් ඔහුට නපුරක් කළ ද එම සම්බන්ධතාව අඛණ්ඩව සුරකියි. ඔවුන් වෙත උපකාරශීලීව කටයුතු කරයි.

http://www.sunnah.global/hadeeth/si/show/3854